# රුහුණ විශ්වවිද්‍යාලය

# සමාජවිද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාලාව - 2023/2024
## (SLQF 9 මට්ටම)

රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය මගින් මෙහෙයවනු ලබන ඉහත සඳහන් උපාධි පාඨමාලාවේ 9 වන කණ්ඩායම සඳහා සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. පාඨමාලාවේ ලියාපදිංචියට අවශ්‍ය අවම සුදුසුකම්**

I. සමාජවිද්‍යාව විෂයෙන් අර්ස 30 ඇතුළත්ව පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හෝ

II. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සහිතව සමාජවිද්‍යා විෂය ක්ෂේත්‍රයෙන් අර්ස 30 කට සමකල හැකි පළපුරුද්දක් හෝ පූර්ව හැදෑරීමක් කර තිබීම (රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි විය යුතුය.)

III. ඉහත I හෝ II ට සම කළ හැකි සහ රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි වෙනත් සුදුසුකමක් ලබා තිබීම.

IV. රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි පරිදි සමාජවිද්‍යා විෂය ක්ෂෙත්‍රයේ දැනුමක්/ පළපුරුද්දක් සහිතව NVQ – 7 සම්පූර්ණ කර තිබීම. (අවශ්‍ය විකල්ප සුදුසුකම් දැන ගැනීම සඳහා පශ්චාද් උපාධි අධ්‍යයන පීඨ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න)

- **දේශන පැවැත්වීම** : **සෙනසුරාදා පෙ.ව. 8.00 - ප.ව. 5.00 දක්වා**
- **අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය** : **2023 අගෝස්තු 31**
- **දේශන මාධ්‍ය** : **සිංහල**
- **පාඨමාලාවේ කාල සීමාව** : **අධ්‍යයන වර්ෂ එකක් හෙවත් සමාසික දෙකකි**
- **පාඨමාලා ගාස්තුව** : **රු.150,000.00**

**02. අයදුම්පත් ලබා ගැනීම**

අයදුම්පත් ලබා ගැනීම සඳහා රු.1500/-ක මුදලක් ඕනෑම මහජන බැංකු ශාඛාවකින් යොමු අංක 322092400000012 (ගිණුම් අංකය ලෙස භාවිතා කරන්න) යටතේ රුහුණ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන රැස් කිරීමේ ගිණුමට බැරවන සේ ගෙවා ලබා ගත් ලදුපතෙහි පිටුපස පාඨමාලාවේ නම සහ අයදුම්කරුගේ ලිපිනය පැහැදිලිව සඳහන් කර රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පීඨ කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වේ. අයදුම්පත් තැපෑලෙන් ලබා ගැනීමට තමන්ගේ නම හා ලිපිනය ලියූ රු. 110/- ක මුද්දර ඇලවූ 9’’×4’’ ප්‍රමාණයේ ලිපි කවරයක් සමඟ පෙර කී පරිදි රු.1500/- ගෙවා ලබා ගත් ලදුපත **නියෝජ්‍ය ලේඛකාධිකාරී, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, නො.115, ශ්‍රී ධර්මාරාම මාවත, කොටුව, මාතර** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් **2023 අගෝස්තු 18** දිනට පෙර එවිය යුතුය.

සම්පූර්ණ කළ අයදුම්පත් **2023 අගෝස්තු 31 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් නියෝජ්‍ය ලේඛකාධිකාරී, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, නො.115, ශ්‍රී ධර්මාරාම මාවත, කොටුව, මාතර.** යන ලිපිනයට එවිය යුතුය. ලිපියේ වම්පස ඉහළ කෙළවරේ **“සමාජවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව”** ලෙස සඳහන් කළ යුතුය.

අයදුම්පත් භාගත කර ගැනීම (Download) සිදුකළ හැකිය. (මේ සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ වෙබ් අඩවිය www.fgs.ruh.ac.lk වෙත පිවිසෙන්න.)

**ලේඛකාධිකාරී**
**රුහුණ විශ්වවිද්‍යාලය**
2023.07.20